
# මසුන් අල්ලන්නන්

–Fishers of men–



22Page

**පොතේ ගුරා** එක දවසක්, යේසුස්වහන්සේ ගලීලයේ මුහුදට ගියා. පේත්‍රුස් නම් මසුන් අල්ලන්නෙක් ඔහුගේ සහෝදරයා වන ඇන්ඩෘ සමගින් මසුන් අල්ලමින් එහි සිටියා.

**පේත්‍රුස්** අයියෝ... මාලු... ෂිහ්... අපි මුලු රෑම වෙහෙසුණා. ඒත් එක මාලුවෙක්වත් අල්ලගන්න බැරි වුණා. ෂාහ් හහ්.. හා... හේ හේ...

**පොතේ ගුරා** පේත්‍රුස් සහ ඇන්ඩෘ අධෛර්යයට පත් වී බෝට්ටුව වෙරළට ගසා, දැල් සෝදන පිණිස ඔවුන් වතුරට බැස්සා. මේ වෙලාවේ යේසුස්වහන්සේ ගලීලයේ මුහුදු වෙරළට එනවා. යේසුස්වහන්සේ සමගින් ගොඩක් පිරිසක්ද පැමිණියා. යේසුස්වහන්සේ ඇවිත් පේත්‍රුස් ගේ ඔරුවට නැගී " ඔරුව වෙරළෙන් ටිකක් ඈත් කරන්න පුලුවන්ද? " යී ඇසුවා. පේත්‍රුස් සිටන සෙනගට උන්වහන්සේව පෙනෙන ආකාරයට, වෙරළෙන් ටිකක් ඔබ්බට, ඔරුව දියත් කළා. එවිට යේසුස්වහන්සේ ඔරුවේ වාඩි වී සියලු දෙනාටම දේව රාජ්‍යය ගැන ඉගැන්වුවා. කතාකර නිම වී යේසුස්වහන්සේ පේත්‍රුස් ට මෙහෙම කීවා...

**යේසුස්වහන්සේ** ගැඹුරට ගොස් මාලු දැල දාන්න...

**පේත්‍රුස්** ස්වාමීනි... අපි මුලු රෑම වෙහෙසුණා. ඒත් මොකවත් ඇල්ලුවේ නෑ. ... ඒත් ඔබවහන්සේ කියන නිසා මම දැල දාන්නම්...

**පොතේ ගුරා** පේත්‍රුස් සහ ඇන්ඩෘ මාලු ඇල්ලීමේ සූරයින් ය. දක්ෂයන් ය. එයාලා මුලු රෑම උත්සහ කරළත් එකම මාලුවෙක්වත් ඇල්ලුවේ නෑ. එහෙත් යේසුස්වහන්සේ කියනවා, නැවතත් දැල් දාන්න කියා. ඇත්තටම යේසුස්වහන්සේ කී දේට සරදම් හිනාවක් නගන්න පේත්‍රුස් සහ ඇන්ඩෘට පුලුවන්කම තිබුණා. එහෙත් ඔවුන් යේසුස්වහන්සේ කී දේ ඒ විදිහටම කළා...

........................................................................................................



23Page


**පේත්‍රුස්** ඕහ්... ඕ... අදින්න... අදින්න... මෙහ්... මේක කොහොමද අදින්නේ ?

**පොතේ ගුරා** පේත්‍රුස් සහ ඇන්ඩෘ වික්ෂිප්තව පුදුමයෙන් පුදුමයට පත් වුණා. ඔවුන්ගේ දැල් පිරෙන තරමටම මාලු... "කොපමණ නම් මාලු ඇල්ලුවාත් කීවොත් දැල් පිරී ඉරෙන්න ගත්තා" ඒ ළග සිටිය යාකොබ්ද යොහාන්ද මේ දේ දුටුවා. ඔවුන් හැමදෙනාම උන්වහන්සේට දණනමා වැන්දා...

**යේසුස්වහන්සේ** භයවෙන්න එපා... මෙතැන් පටන් ඔයාලා තවත් මසුන් අල්ලන්නන් නොව මිනිසුන් අල්ලන්නන් වේවි...

**පොතේ ගුරා** පසුව ඔවුන් සියල්ලෝම වෙරළට ඇවිත්, ඔවුන් සතුව තිබූ සියල්ලම අත්හැර යේසුස්වහන්සේ පසුපස ගියා. පේත්‍රුස්, ඇන්ඩෘ, යාකොබ්, යොහාන් යන සියලුදෙනාම පසුව යේසුස්වහන්සේගේ ගෝලයන් බවට පත් වුණා.

දවසක් දා මතෙව් නම් මිනිසෙක්ද යේසුස්වහන්සේට මුණ ගැහුණා. ඔහු බදු අය කරන්නෙක්. ඒ කාලයේ මේ බදු අයකරන්නන් මිනිසුන්ගෙන්



24Page

පමණට වඩා ගොඩක් මුදල් අයකරගත් නිසා මිනිසුන් ඔවුන්ට වෛර කළා. මිනිසුන් මතෙව්ට ද සැළකුවේ පව්කාරයෙක් ලෙසටයි. ඒත්, යේසුස්වහන්සේ ඔහුට මෙසේ කීවා...

**යේසුස්වහන්සේ** මා අනුව එන්න...

**පොතේ ගුරා** ඉන් පසුව මතෙව් නැඟිට, ඔහු සතුව තිබූ සියල්ලම අත්හැර, යේසුස්-වහන්සේ අනුව ගියා. යේසුස්වහන්සේ, මතෙව් ගේ නිවසේ දී බදු අයක-රන්නන් සහ පව්කාරයන් සමග කෑම කනවා ඵරිසිවරුන් දැක, ඒ ගැන ඔවුනොවුන් අතරේ කොඳුරන්නට පටන් ගත්තා.

.......................................................................................



25Page

**ඵරිසිවරුන්** හ්ම්... ඔබ මොකද මේ පව්කාරයන් සමඟ කෑම කන්නේ ?

**යේසුස්වහන්සේ** රෝගීන්ට මිස නිරෝගීන් වෙදාගෙන් එලක් නැත. මම ආවේ ධර්මිෂ්ඨයන් කැඳවන්නට නොව පව්කාරයන් කැඳවන්නටයි. අන්න ඒ නිසයි මම මේ මිනිස්සු එක්ක මෙතැන ඉන්නේ ...



26Page

**පොතේ ගුරා** මෙන්න මේ වගේ යේසුස්වහන්සේ විසින් ගෝලයන් 12 දෙනෙකුට කැඳවීමක් දුන්නා. ඒ ගෝලයන් වසර 3ක් පුරා උන්වහන්සේ පසුපස යමින්, උන්වහන්සේගෙන් බොහෝ දේවල් ඉගෙන ගත්තා. යේසුස්-වහන්සේ ස්වර්ගයට නැග ගියාට පසුව ඒ ගෝලයන් විසින් උන්වහන්සේ මේ පොළොවේ සිටියදී කළ දේ දිගින් දිගටම කරගෙන ගියා. යේසුස්-වහන්සේ වගේම ඔවුන් ද දේව රාජ්‍යය ගැන දේශනා කරමින් රෝගීන් ද සුව කරනු ලැබුවා.



27Page

**ජීවිතයට අදාල කිරිම** දුවේ පුතේ, යේසුස්වහන්සේ කෙනෙක් දිහා බලද්දී උන්වහන්සේ දැක්කේ, “අපෝ එයා පව්කාරයෙක්....” අන්න ඒ වගේ නොවේ, ඒ පුද්ගලයා අනාගතයේදී කවුරුන් විය හැකිද කියා උන්වහන්සේ හඳුනාගත්තා. උන්-වහන්සේ දන්නවා, ඔයා අනාගතේ කවුරුන් වේවිද කියා. ෂාහ්... නියමයි නේද? උන්වහන්සේට ස්තුතියි කියන්න.